# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2254/5 - 2021 නොවැම්බර් මස 15 වැනි සඳුදා - 2021.11.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ අංකය : ඩීඑච්ඕ/එල්ඒඑන්/ඒසීකිව්ටීඑන්/ඒ3/2/10.
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය : 4-3/5/2013/එච්ඩබ්ලිව්/482(1).

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:*

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පනාවල් කෝරළයේ නැගෙනහිර සුළු කොට්ඨාසයේ, අංක 122 බී, මඩගම්මන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ මඩගම්මන ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් වෙනුවෙන් කෑගල්ල දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් පිළියෙල කරන ලද මූලික පිඹුරු අංකය කෑ/ 3789 හා 2021.01.27 දිනැති පිඹුරේ කැබලි අංක 1 සිට 3 දක්වා පෙන්නුම් කර ඇති මුළු බිම් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0187 ක් වූ පහත සඳහන් ඉඩම් කොටස් (03):

01. **කැබලි අංක 1**

ඉඩමේ නම: ඇහැළියගොඩවත්ත; ඉඩමේ විස්තරය: වත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් පාන්නා: මඩගම්මන ආරච්චිලාගේ කරුණාවතී; ප්‍රමාණය: හෙක්. 0.0039.

02. **කැබලි අංක 2**

ඉඩමේ නම: ඇහැළියගොඩවත්ත; ඉඩමේ විස්තරය: වත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් පාන්නා: මඩගම්මන ආරච්චිලාගේ කරුණාවතී; ප්‍රමාණය: හෙක්. 0.0004.

03. **කැබලි අංක 3**

ඉඩමේ නම: ඇහැළියගොඩවත්ත; ඉඩමේ විස්තරය: වත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් පාන්නා: මඩගම්මන ආරච්චිලාගේ සුමනාවතී; ප්‍රමාණය: හෙක්. 0.0144.

ඉහත සඳහන් ඉඩමට /පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලි වලින් බලයලත් අයවලුන් හෝ 2021 දෙසැම්බර් මස 20 වැනි දින පෙරවරු 10.00 ට දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද 2021 දෙසැම්බර් මස 06 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

යූ. පී. චන්දන අනුරුද්ධ පියදාස,
ප්‍රාදේශීය ලේකම්,
දෙහිඕවිට.

2021 ඔක්තෝබර් මස 14 වැනි දින,
දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

11 - 640



මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## ශුද්ධිපත්‍රිකාව

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 7 වැනි වගන්තිය යටතේ දැන්වීම

අංක 1444/17 හා 2006 මැයි 10 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය හා බැඳේ.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තර:*

ගාල්ල දිස්ත්‍රික්කයේ බලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 17 හැගල්ල පියගම ග්‍රාම නිලධාරි වසමේ හැගල්ල-පියගම ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද මු.පි.ගා. 3455 හා 2020.09.25 දිනැති සංශෝධිත පිඹුරේ කැබලි අංක 02 ලෙස පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0128ක් පමණ වූ සළුතිලකවත්ත නමැති ඉඩම :

**කැබලි අංක 2 - සළුතිලකවත්ත - ප්‍රමාණය: හෙක්ටයාර් 0.0128**

*උතුරට* : වයලට් මෙන්ඩිස් හිමිකම් කියන සළුතිලකවත්ත; *නැගෙනහිරට*: වයලට් මෙන්ඩිස් හිමිකම් කියන සළුතිලකවත්ත; *දකුණට*: මාර්ගය (ප්‍රාදේශීය සභාව); *බටහිරට* : වයලට් මෙන්ඩිස් හිමිකම් කියන සළුතිලකවත්ත

ඉහත සඳහන් ඉඩමට /පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියළුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලි වලින් බලයලත් අයවලුන් හෝ 2022 පෙබරවාරි මස 09 දින පෙරවරු 10.00 ට බලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද 2022 පෙබරවාරි මස 02 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම / ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

**ආර්. එම්. අයි. බී. එම්. සී. බී. ජයසිංහ,**
**ප්‍රාදේශීය ලේකම්,**
**බලපිටිය.**

2021 නොවැම්බර් මස 05 වැනි දින,
බලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය.

11 - 641

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.